**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය - 2014**

**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 01 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(I) සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්ව විද්‍යාල පනතේ 108 (2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2015 ජුනි 09 වන දින නිකුත් කරන ලදී.**

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

## 1.3 විගණකගේ වගකීම

**මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.**

**මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.**

**මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**2.** **මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1** **මතය**
**--------------**

**මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**2.2** **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
**------------------------------------------------------------------**

**පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.**

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 751, 755 සහ 1979 නොවැම්බර් 13 දිනැති අංක 48 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4 ඡේදය | අදාල රෙගුලාසි පරිදි නිලධාරීයා විසින් මාරුවක් ලැබ යාමට පෙර තම භාරයේ ඇති භාණ්ඩ වගකිව යුතු නිලධාරියෙකුට පැවරිය යුතු පරිදි ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා ගෙන ගොස් නොතිබුණු අතර එම භාණ්ඩ අදාළ අංශ වල නිලධාරීන්ගේ වගකීමට පත්කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371 | නිලධාරියෙකු විසින් ලබාගන්නා අත්තිකාරම් එය දෙනලද කාර්ය නිමකළ විගසම පියවියයුතු වුවත් අවස්ථා 08 කදී එකතුව රු.3,236,673 ක් වූ අත්තිකාරම් සති දෙකකට වඩා වැඩි කාලයක් ප්‍රමාදවී පියවා තිබුණි. එසේම අවශ්‍යතාවය ඉක්මවා එකතුව රු.53,435 ක අත්තිකාරම් ලබාගෙන තිබුණි. |
| (ඇ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන සියළුම නිළධාරීන් පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කළ යුතු වුවත් නිලධාරීන් 04 දෙනෙකු පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කිරීමකින් තොරව එකතුව රු.10,432,909 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. |
| (ඈ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනයේ පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඊ/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේද | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වත්කම් ප්‍රතිසම්පාදන අරමුදල (Assets Replacement Fund) ඇතිකර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | **2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවෙහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**3.** මූල්‍ය සමාලෝචනය

**3.1** මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, **2014** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.**9,687,231**ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.**7,823,423** ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**1,863,808** කින් වැඩිවීම සඳහා රජයේ ප්‍රදාන රු.**9,738,000** කින් වැඩිවීම සහ උපයන ලද ආදායම් රු.**1,950,447** කින් වැඩිවීම බලපා තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

**4.1** කාර්යමණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් **31** දිනට අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු **05** ක් විය.

**5.** ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

**5.1** සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව ආයතනයක් විසින් සිය සංයුක්ත සැලැස්ම හා වාර්ෂික අයවැය ලේඛනය අදාළ වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවත් එම වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2014 මැයි 10 දිනදීය. තවද ආයතනය විසින් ඉදිරිපත් කළ 2014 - 2018 සඳහා වූ සංයුක්ත සැලැස්මෙහි හා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් වූ **Establishment and maintenance of mitochondrial DNA database** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.2** ප්‍රසම්පාදන සැලැස්ම

**2006** වර්ෂයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ **4.2.1** වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අවම වශයෙන් මාස **06** කට වරක් යාවත්කාලීන කළයුතු වුවත් එපරිදි කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අවස්ථා **07** කදී එකතුව රු.**2,359,590** ක මිලදී ගැනීම් ඇතුළත් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.**

**(අ) ස්ථාවර වත්කම්**
**(ආ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය**
**(ඇ) තොග පාලනය**
**(ඈ) අත්තිකාරම්**